# ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් විදුහල්පති තනතුරුවලට පත්කිරීම සඳහා සිදුකරනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ ක්‍රමවේදය.

**I.** අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම්.

(අ) සහ (ආ) යටතේ ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.

**(අ)** අධ්‍යාපන සුදුසුකම් (උපරිම ලකුණු 10)

| | | |
|---|---|---|
| පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධිය හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 10 |
| ප්‍රථම උපාධිය | - | ලකුණු 07 |
| අ.පො.ස.(උ.පෙළ) | - | ලකුණු 04 |
| අ.පො.ස.(සා.පෙළ) | - | ලකුණු 03 |

**(ආ)** වෘත්තිය සුදුසුකම් (උපරිම ලකුණු 10)

| | | |
|---|---|---|
| පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා,පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව | - | ලකුණු 10 |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව | - | ලකුණු 07 |
| ගුරු පුහුණු සහතිකය | - | ලකුණු 04 |
| පිළිගත් ආයතනයකින් ලබා ගත් වෙනත් මාස තුන හෝ ඊට වැඩි වැඩි සහතික පත්‍ර පාඨමාලා | - | ලකුණු 03 |

**(ඇ)** මේ යටතේ පහත සඳහන් සුදුසුකම් ලබා ඇත්නම් **(1)** (අ) යටතේ ලබාගන්නා ලකුණු වලට අමතරව පහත සඳහන් ලකුණු ප්‍රමාණය හිමිවේ.

**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම (මේ යටතේ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ)**

| | | |
|---|---|---|
| 1. | ඉංග්‍රීසි උපාධි (උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ඇත්නම්) | ලකුණු 04 |
| 2. | ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් හෝ උපාධියට විෂයක් ලෙස හදාරා ඇත්නම් | ලකුණු 03 |
| 3. | අ.පො.ස. උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සමත් | ලකුණු 02 |
| 4. | තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවම හෝ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 6 කට වැඩි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | ලකුණු 01 |

**තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම (මේ යටතේ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ)**

1. තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය ලකුණු 04
2. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් ලකුණු 03
3. අ.පො.ස උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ තොරතුරු තාක්ෂණය සමත් ලකුණු 02
4. තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවම හෝ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 6 කට වැඩි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. ලකුණු 01

**දෙමළ භාෂාව පිළිබඳ දැනුම (මේ යටතේ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ)**

1. දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ලකුණු 03
2. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙමළ භාෂා පාඨමාලාවක් (රජයේ සේවය සඳහා අවශ්‍ය දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා අදාළ නොවන) අ.පො.ස උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ දෙවන භාෂාව සමත් ලකුණු 02
3. දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. ලකුණු 01

**II.** පාසලේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ලබා දී ඇති දායකත්වය.(උපරිම ලකුණු 10)

විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ලකුණු ලබා දීමේ දී වසර 03 ක විභාග ප්‍රතිඵල ඇගයීම සඳහා භාජනය කෙරේ. වසර 03 හි ප්‍රතිඵලවල සමත් ප්‍රතිශතයෙහි සාමාන්‍ය අගය සලකා ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ. ප්‍රාථමික අංශය පමණක් සහිත පාසල්, ද්විතීයික අංශය පමණක් සහිත පාසල් හා අංශ දෙකම ඇති පාසල් පවතින බැවින් (අ) හෝ (ආ) යන දෙකෙන් එකක් යටතේ පමණක් ලකුණු ලබා දේ.

**(අ)** 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය (උපරිම ලකුණු 10)

මෙම එක් එක් ලකුණු සීමාවේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පාසලේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 50 % ඉක්මවයි නම් පමණක් අදාළ ලකුණු ප්‍රමාණය පිරිනැමිය යුතුයි.

විභාග දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති ප්‍රතිඵල ලේඛන අනුව ලකුණු 70 ඉක්මවා ඇති සිසුන් ප්‍රතිශතය (වසර 3ක සාමාන්‍ය අගය),

| | |
|---|---|
| 80%ට ඉහළ | ලකුණු 10 |
| 70% - 79%ත් අතර | ලකුණු 08 |
| 60% - 69%ත් අතර | ලකුණු 06 |
| 50% - 59%ත් අතර | ලකුණු 04 |
| 40% - 49%ත් අතර | ලකුණු 02 |

**(ආ)** අ.පො.ස.(සා.පෙළ) විභාගය (උපරිම ලකුණු 10)

ගණිතය, මව්බස යන විෂයයන් සහිතව විෂයයන් 6 ක් සමඟ සම්මාන 03ක් ලබා සමත් වීමේ ප්‍රතිශතය මෙහිදි සලකා බලනු ලැබේ.

| | | |
|---|---|---|
| 80%ට ඉහළ | - | ලකුණු 10 |
| 70% - 79% අතර | - | ලකුණු 08 |
| 60% - 69% අතර | - | ලකුණු 06 |
| 50% - 59% අතර | - | ලකුණු 04 |
| 40% - 49% අතර | - | ලකුණු 02 |

**III.** විෂය බාහිර/ විෂය සමගාමී ජයග්‍රහණ සඳහා ලබා දී ඇති දායකත්වය (උපරිම ලකුණු 10)

අදාළ අයදුම්කරුගේ නායකත්වය යටතේ පාසල සඳහා අත් කර දී ඇති සුවිශේෂ ජයග්‍රහණ සලකා බලා මෙම ලකුණු ප්‍රදානය කළ යුතු වේ. සේවා කාලය තුළ ලබා ඇති සෞන්දර්ය, ක්‍රීඩා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලත් වෙනත් විෂය සමගාමී ජයග්‍රහණ සලකා බැලිය යුතු අතර මෙම ජයග්‍රහණය අධ්‍යාපන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හෝ රජයේ අමාත්‍යාංශයක්/ දෙපාර්තමේන්තුවක් හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ආයතනයක් මඟින් මෙහෙයවන අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව සහභාගී වන තරඟාවලියක දී ලද ජයග්‍රහණයක් විය යුතුය.

මෙම ලකුණු ප්‍රදානය කිරීමේ දී එක් ඉසව්වක් සඳහා ලබා ඇති උපරිම ජයග්‍රහණය සඳහා එක් මට්ටමක දී පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. විවිධ ජයග්‍රහණ සඳහා උපරිම ලකුණු 10 ට යටත් ව ලකුණු උපයා ගත හැකි වේ.

| | | |
|---|---|---|
| ජාත්‍යන්තර ජයග්‍රහණ | - | ලකුණු 10 |
| ජාත්‍යාන්තර නියෝජනය | - | ලකුණු 06 |
| ජාතික/ සමස්ත ලංකා ජයග්‍රහණ | - | ලකුණු 04 |
| පළාත් ජයග්‍රහණ | - | ලකුණු 03 |
| කලාප ජයග්‍රහණ | - | ලකුණු 02 |

**IV.** විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් පද්ධතිය වෙත අත් කර දී ඇති නිර්මාණශිලි ප්‍රතිඵල(උපරිම ලකුණු 10)

තම සේවා කාලය තුළ ක්‍රියාත්මක කර ඇති විශේෂ වැඩසටහන්/ ව්‍යාපෘති සඳහා මෙම ලකුණු ලබාදෙනු ලැබේ. අයදුම්කරු විසින් ම ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කළ යුතු අතර, මෙම ව්‍යාපෘතිවල අදාළ අපේක්ෂිත අරමුණු ඵලදායීව ඉටුකර ගැනීමට සමත් වූයේද යන්න අදාළ විෂයය භාර අධ්‍යක්ෂ/ කොට්ඨාශ අධ්‍යක්ෂ/ කලාප අධ්‍යක්ෂ හෝ අදාළ බලධාරියා විසින් සහතික කර තිබිය යුතුයි.

එක් විශේෂ ව්‍යාපෘතියක්/ වැඩසටහනක් සඳහා ලකුණු 2 බැගින් උපරිම ලකුණු 10 කි.

- ප්‍රතිඵල සංවර්ධනය/ විෂය සංවර්ධන සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්
- ඌණ සම්පත් කළමනාකරණය/ භෞතික සම්පත් වර්ධනය සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්
- මානව සම්පත් සංවර්ධනය/ ප්‍රජාවේ සුබ සිද්ධිය සඳහා ක්‍රියාත්මක කර ඇති සුවිශේෂ වැඩසටහන්
- පරිසර වැඩසටහන්/ සාමාජීය වැඩසටහන්
- බලාදක්ෂ/ ශීඝ්‍රාහට හෝ වෙනත් විශේෂ නිර්මාණශීලී ක්‍රියාකාරකම්

**V.** සේවය සඳහා ලබා ඇති ඇගයීම්. (උපරිම ලකුණු 10)

තම සේවා කාලය තුළ දී ලබා ඇති සේවා ඇගයීම් සඳහා ලකුණු ප්‍රදානය කළ යුතු ය. උපරිම ලකුණු 10ට යටත්ව ඉහළම ඇගයීම් අවස්ථාව සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| ජාතික මට්ටමේ ඇගයීම් | - | ලකුණු 10 |
| පළාත් මට්ටමේ ඇගයීම් | - | ලකුණු 05 |
| කලාප මට්ටමේ ඇගයීම් | - | ලකුණු 03 |

VI. පාසල් අධ්‍යාපනයේ ගුණත්ව දර්ශකය (ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය - 5)

| | |
|---|---|
| 80% ට වැඩි | ලකුණු 05 |
| 70% - 79% අතර | ලකුණු 04 |
| 60% - 69% අතර | ලකුණු 03 |
| 50% - 59% අතර | ලකුණු 02 |

VII. ප්‍රශංසා සහ දෝෂ දර්ශන

පොදු 230 බී ආකෘතියේ ලබා දී ඇති එක් සේවා ප්‍රශංසාවක් සඳහා ලකුණු 02 බැගින් (උපරිම ලකුණු 06 කි.)

නියමිත ආකෘතියෙන් ලබාදි ඇති එක් දෝෂ දර්ශනයක් සඳහා ලකුණු 02 බැගින් අඩු කරනු ලැබේ.

VIII. පසු ගිය වසර 3 තුළ ලබා නොගත් නිවාඩු සඳහා පහත පරිදි ලකුණු ලබාදෙනු ලැබේ. අනියම්/ විවේක නිවාඩු වල එකතුවෙන්, (උපරිම ලකුණු 06)

| | | |
|---|---|---|
| ❖ ලබානොගත් නිවාඩු | 80% හෝ ඊට වැඩි | ලකුණු 06 |
| | 50% / 79% | ලකුණු 04 |
| | 25% / 49% | ලකුණු 02 |
| | 25% අඩු | ලකුණු 01 |

IX. ජ්‍යෙෂ්ඨතාවය(උපරිම ලකුණු 10)

විදුහල්පති සේවයේ සේවා කාලය වසර 1 කට ලකුණු 1 බැගින් උපරිම කාලය වසර 10 ක් සඳහා ලකුණු ලබාදිය යුතුයි.

පුරප්පාඩු සහිත පාසල සඳහා අනුමත විදුහල්පති ශ්‍රේණියට අදාළව මෙම ලකුණු ප්‍රදානය කළ යුතුයි. එහි දී ජ්‍යෙෂ්ඨතාවය සඳහා හිමි ලකුණු ප්‍රදානය කරනු ලබන්නේ අයදුම්කරු තමා අයදුම්කරන පාසලට අනුමත විදුහල්පති ශ්‍රේණිධාරියෙකු නම් පමණි.

(උදා 1AB පාසලක් සඳහා අයදුම්කරන විදුහල්පතිවරුන්ට ජ්‍යෙෂ්ඨතාවයට හිමි ලකුණු ලබා දිය යුතු වන්නේ විදුහල්පති 1 ශ්‍රේණියේ සේවා කාලය සම්පූර්ණ කර ඇති වසර ගණන (උපරිම වසර 5) සඳහා පමනි. 11 හා 111 ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන් ද අයදුම් කර ඇත්නම් මෙම ලකුණු හිමි නොවේ.)

X. සෑම අයදුම්කරුවකු විසින් ම තමා පෙර සිටි තනතුරට අදාළව සිදුකරනු ලැබූ අධ්‍යාපන/ භෞතික/ මානව සම්පත් සංවර්ධනයට අදාළව සිදු කරන ලද ව්‍යාපෘතියක් හා තමා පත්විමට නියමිත තනතුරට අදාළව අධ්‍යාපන/ භෞතික හා මානව සම්පත් සංවර්ධනය

උදෙසා ඉදිරියේ දී කිරීමට අදහස් කරන ව්‍යාපෘති/ යෝජනා සම්බන්ධව මිනිත්තු 05 බැගින් මිනිත්තු 10 ක ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු ය. (සිදුකරන ලද ව්‍යාපෘතිය සම්බන්ධව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තහවුරු කර තිබීය යුතු යි. ) ලකුණු 05 බැගින්

- ලකුණු 10

**XI.** සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව සඳහා - ලකුණු 10

**04.** සාමාන්‍ය කරුණු

I. ආසන්න වසර 5 ක තුළ අවවාද කිරීම් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

II. ආසන්න වසර 5 ක තුළ සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර එම වසර 5 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

III. මෙම තනතුරු සඳහා අයදුම් කළ හැක්කේ උතුරු මැද පළාත් සභාවේ සේවයේ නියුතු විදුහල්පති සේවයේ අයට පමණි.

**05.** නියෝජ්‍ය විදුහල්පති සහ සහකාර විදුහල්පති තනතුරු දරන අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දීම.

මෙම පරිපාටියට අනුව නියෝජ්‍ය විදුහල්පති සහ සහකාර විදුහල්පති තනතුරු දරන අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දීමේ දී II, III හා IV සඳහා හිමි සම්පූර්ණ ලකුණුවලින් 75% ක ප්‍රතිශතයක් පමණක් ලබා දෙනු ලැබේ. තවද නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිවරයකු ඊට පෙර විදුහල්පති තනතුරක් දැරූ වේ නම් එම කාල සීමාවකට අදාළව වසර 03 ක කාලය සඳහා ඉහත 11,111,1V යටතේ සම්පූර්ණ ලකුණු ලබාගැනීමට හිමිකම ඇත. එහි දී නියෝජ්‍ය/ සහකාර විදුහල්පති කාල සීමාවට අදාළව ලකුණු ලබාගැනීමට හිමිකමක් නැත. කෙසේ වෙතත් විදුහල්පති ධුරයේ කාල සීමාව වසර 03 කට අඩු වන අවස්ථාවක දී නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිධුරයට අදාළව අනුපාතිකව ලකුණු ලබාගත හැකි ය.

**06.** අදාළ සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවූ අවස්ථාවක ගන්නා ක්‍රියාමාර්ග.

1. යම් පුරප්පාඩු සහිත පාසලක් සඳහා අදාළ ශ්‍රේණියට අනුව සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති නම්, ඊළඟ ශ්‍රේණියේ අයදුම්කරුවන්ගෙන් එම පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

2. යම් පාසලක් සඳහා කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවන අවස්ථාවක දී කාර්ය සාධනය සැලකිල්ලට ගෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය මත පළාත් අධ්‍යාපන ලේකම් විසින් සුදුසු විදුහල්පතිවරයෙකු ස්ථාන ගත කරනු ලැබේ.

**විශේෂ කරුණු**

ලකුණු පරිපාටිය අනුව ලකුණු ලබාදීම හා සමගාමීව පහත සඳහන් පරිදි පාසලක සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගනිමින් පාසලකට පත් කළ යුතු විදුහල්පතිවරයාගේ ශ්‍රේණිය තීරණය කරනු ලබයි.

| පාසල් කාණ්ඩය | විදුහල්පතිවරයාගේ ශ්‍රේණිය |
|---|---|
| 1AB | ශ්‍රී ලං.වි.සේ. 1 |
| 1C හෝ සිසුන් 1000ට වැඩි 2 හා 3 වර්ගයේ පාසල් | ශ්‍රී ලං.වි.සේ. 1, 11 |
| 2 හා 3 | ශ්‍රී ලං.වි.සේ. 111 |

- එක් එක් පාසල් සඳහා අනුමත ශ්‍රේණියේ විදුහල්පතිවරු පමණක් පත්කරනු ලැබේ.
- යම් පාසලක් සඳහා අනුමත ශ්‍රේණියේ විදුහල්පති සේවයේ නිලධාරින් ඉල්ලුම්කර නොමැති අවස්ථාවල අනුමත ශ්‍රේණියට පහළ ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ගෙන් ලකුණු ලබාගත් නිලධාරියා විදුහල්පති ලෙස පත් කරනු ලැබේ.
- සියලුම කාණ්ඩවල විදුහල්පති තනතුර සඳහා ඕනෑම ශ්‍රේණියක විදුහල්පතිවරුන්ට අයදුම් කළ හැකි අතර, අදාළ ශ්‍රේණියේ විදුහල්පතිවරුන් එම පුරප්පාඩු සඳහා අයදුම්කර ඇති අවස්ථාවක එම ශ්‍රේණියේ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. නො එසේනම් පමණක් ඊට පහළ ශ්‍රේණියේ අය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර වැඩිම ලකුණු ලබාගන්නා නිලධාරියා විදුහල්පති ලෙස පත් කරනු ඇත.
- අධිසේවක පදනම යටතේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වීම් ලැබී ඇති නිලධාරීන් සඳහා විදුහල්පතිවරු පත්කිරීමේ පරිපාටිය යටතේවන පත්කිරීම් සඳහා සලකා නොබැලේ.
- තම සුදුසු කම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු අතර පසුව කරන ඉල්ලීම් පිළිබඳ සලකා බලනු නොලැබේ.